# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 494/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 21/03/2024 පැය 0720

## මාධ්‍ය නිවේදනය

**සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයින් සිව්දෙනෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.03.19 වන දින සිට පොලිස්පතිතුමාගේ උපදෙස් පරිදි ක්‍රියාත්මක කරන ලද සංවිධානාත්මක අපරාධ මැඩලීමේ විශේෂ මෙහෙයුම මගින් කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් විසින් වැටලීමක් සිදුකර සංවිධානාත්මක අපරාධ කණ්ඩායම් 03ක සාමාජිකයන් සිව්දෙනෙකු 2024.03.20 වන දින අයිස්, හෙරොයින් මත්ද්‍රව්‍ය සහ කඩු සමඟ අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 44, 26, 23 හා 28 යන වයස්වල පසුවන පිළිවලින් මරදාන, මෝදර, ග්‍රෑන්ඩ්පාස් හා මාලිගාවත්ත යන ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන් සන්තකයේ තිබී පිළිවලින් හෙරොයින් ග්‍රෑම් 02 මිලිග්‍රෑම් 450, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 800ක් හා කඩු 02ක්, හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 510, අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 03 මිලිග්‍රෑම් 160 ක් අත්අඩංගුවට ගෙන ඇත. කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**